# ප්‍රාග් ඓතිහාසික මානවයාගේ අභිචාර විධි ආශ්‍රිත කලාව

බී. ඒ. නිපුණ හේමින්ද බස්නායක, කේ. කිත්මි පී. පෙරේරා
කැලණිය විශ්වවිද්‍යාලය
nipunaheminda90@gmail.com

ස්වභාව ධර්මයට බෙහෙවින් හිතැති වූ ද පාරිසරික විචල්‍යතා හමුවේ සරල ව තීරණය ගත්තා වූ ද ලොව ප්‍රාග් මානවයා නූතන මානව ගමන්මගේ පුරෝගාමීයා ය. ශ්‍රී ලංකාවේ දැනට සොයා ගෙන ඇති ප්‍රාග් ඓතිහාසික ලෙන් හා ජනපද ආශ්‍රිත ව හමු වූ සාධක ඇසුරෙන් ඔවුන් සතු කලාකාමීත්වය පිළිබඳ නිගමනය කිරීමේ හැකියාව පවතී. ලාංකේය ප්‍රාග් මානවයා සතු එකී කලාත්මක පක්ෂය ද අදින් වෙසෙස් වූවකි. මෙම පර්යේෂණයේ දී ප්‍රාග් මානවයා භාවිත කළ අභිචාර විධි හා ඒ ආශ්‍රයෙන් හැදී වැඩුණු කලාව පිළිබඳ ව අවධානය යොමු කරන අතර මෙතෙක් පර්යේෂකයන්ගේ අවධානයට නිසි වූයේ හුදෙක් සොහොන් නිර්මාණය, හරණී නිර්මාණය, ආභරණ භාවිතය ආදිය වුව ද එම භාවිතයන් ඔස්සේ දෙවනුව හෙළි කරන්නා වූ කලාත්මක භාවය විවරණය කිරීම ද මෙහි ලා අභිමත ය. ප්‍රාග් මානවීය අභිචාර විධි මගින් කියාපාන්නා වූ සිරිත්විරිත්වල භාවිතය කෙබඳු වූ කලාත්මක ගුණයක් හෙළි කරන්නේ ද යන්න මෙහි පර්යේෂණ ගැටලුවයි. මෙහි දී ප්‍රාථමික මූලාශ්‍රය ලෙස ක්ෂේත්‍ර අධ්‍යයනය, කෞතුකාගාර නිරීක්ෂණය සහ සාකච්ඡා ද ද්විතියික මූලාශ්‍රය වශයෙන් ග්‍රන්ථ අධ්‍යයනය ද යොදා ගත් අතර සඟරා පුවත්පත් හා අන්තර්ජාල පරිහරණය තෘතීය මූලාශ්‍රය ලෙස යොදා ගැනිණ. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික මානවයා භාවිත කළ විවිධ උපකරණ හා ඉදිකිරීම් ආශ්‍රයෙන් ඔවුන් සතු අභිචාර විධි කිහිපයක් සොයා ගත හැකි විය. ආහාර අනුභවයෙන් අනතුරු ව තමා භාවිතයට ගත් ආහාර ශේෂ තැන්පත් කොට තැබීම, ගොළු බෙල්ලන් හා මුහුදු බෙල්ලන් සිදුරු කොට ආහාරයට ගැනීම, මරණයක දී ආකාර කිහිපයකට තැන්පත් කිරීමේ ක්‍රියාවලිය හා ඒ සඳහා සොහොන් වර්ග කිහිපයක් භාවිතයට ගැනීම, ඇතැම් මළ මිනී පිළිස්සීම හා එකම සුසානය පිළිස්සීම් කිහිපයකට භාවිත කිරීම, මැටියෙන් තැනූ භාජනවල මළ පුද්ගලයාගේ භෂ්මාවශේෂ තැන්පත් කිරීම් හා හෙතෙම භාවිත කළ භාණ්ඩ හා මළ සිරුරේ අස්ථි ආදිය තැන්පත් කිරීම, අස්ථි කොටස් වර්ණ ගැන්වීම, මළ මිනිය තැන්පත් කිරීමේ දී භාවිත හැඩතල යනාදිය ඉන් ප්‍රධාන වේ. එම සෑම අභිචාර ක්‍රමයක් උදෙසා ම ප්‍රාග් මානවයා සතු ව විවිධ උපක්‍රම විය. ඉදිකිරීම් හා උපකරණ ද විය. එම උපකරණ මගින් පැහැදිලි වන කරුණ නම් ඒවායෙහි වූ නිර්මාණශීලී භාවයයි. ඉතිහාසයට පෙර යුගය නියෝජනය කරන මිනිසා ස්වීය අභිචාර විධි මගින් කියා පාන්නේ හුදෙක් ඔවුන් සතු ගෞරවණීය සිරිත්විරිත් නොවන අතර නූතන රූපලාවන්‍ය හා ගෘහ නිර්මාණ ශිල්පීය කලාවේ මූලය යි.

**ප්‍රමුඛ පද :** ප්‍රාග් ඓතිහාසික මානවයා; අභිචාර විධි; ශ්‍රී ලංකාව